# සමුපකාර සේවක කොමිෂන් සභාව - වයඹ පළාත
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு - வடமேல் மாகாணம்
## Co-operative Employees' Commission – North Western Province

මගේ අංකය / எமது இல / My No } සසේකො/2/උපදෙස් ලිපි

ඔබේ අංකය / மது இல / our No }

දිනය / திகதி / Date } 2024.03. 01

උපදෙස් ලිපි 2024/01

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා කාර්ය මණ්ඩල වල,
ගරු සභාපති/ සාමාන්‍යාධිකාරි/කළමනාකරු/විධායක අධ්‍යක්ෂ,

**<u>පුරප්පාඩු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඇගයීම් සිදු කරන නිලධාරීන්ට උපදෙස්.</u>**

වයඹ පළාතේ ක්‍රියාත්මක සියලුම සමුපකාර සමිතිවල පුරප්පාඩු තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඇගයීම් කිරීමේදී ඇගයීම් කරන නිලධාරීන් විසින් පහත උපදෙස් අනුගමනය කරමින් ඇගයීම් කර අයදුම්පත් පිළිබඳව අදාළ නිර්දේශ ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

01. අදාළ පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවීමට නිසි පරිදි බලය/තීරණ ලැබී ඇති බවට සහතික කර ගැනීම.

02. අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම නියමිත චක්‍රලේඛානුකූලව/ නියෝග ප්‍රකාරව නිවැරදි බවට හා අදාළ දැන්වීම ප්‍රසිද්ධ කරමින් අයදුම්පත් කැඳවා ඇති බවට සෑහීමකට පත්වීම.

03. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති සුදුසුකම් පුරප්පාඩු දැන්වීමේ නියම කර ඇති කොන්දේසි/විධි විධානවලට අනුකූලව ඉදිරිපත් කර ඇති බවට සෑහීමකට පත්වීම. (අයදුම්පත් කැඳවන ලද දිනට හෝ සුදුසුකම් සපුරා ගැනීමට නියම කර ඇති දිනට ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා ඇති බවට ආදී වශයෙන්)

04. බඳවා ගැනීමට නියමිත තනතුරට අදාළව නියම කර ඇති මූලික සුදුසුකම් අයදුම්කරුවන් විසින් නියමිත පරිදි සපුරා තිබේද යන්න පරීක්ෂා කර ඒ අනුව අදාළ අයදුම්පත් නිර්දේශ කරන්නේද යන්න පැහැදිලිව සටහන් කිරීම.

05. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කරන්නේ නම්, ප්‍රතික්ෂේප කිරීමට අදාළ කාරණය පිළිබඳව පැහැදිලිව සටහන් කිරීම.

06. ඇගයීම් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති සහතිකයක් සම්බන්ධයෙන් වන ගැටලුවක් කොමිෂන් සභාවේ අවධානයට යොමු කර තීරණ ලබාගත යුතු අවස්ථාවක් වේ නම් අදාළ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට ප්‍රථම අදාළ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභා තීරණ ලබා ගැනීමට කටයුතු කළ යුතු බවට ඇගයීම් මණ්ඩල නිර්දේශයේ සටහන් කිරීම.

07. මූලික සුදුසුකම් වලට අතිරේකව අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති, සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා දීම සඳහා ඇගයීම් කළ හැකි සහතික / සුදුසුකම් පිළිබඳව පහත කරුණු පරීක්ෂා කර බැලීම.

07.1 පාඨමාලාවේ කාල සීමාව.

07.2 පාඨමාලාව වලංගු වන දිනය.

07.3 පාඨමාලාව හදාරා ඇති ආයතනය ස.සේ.කො. 03/2020 හි 05 වගන්තිය යටතේ පිළිගත් ආයතනයක්ද යන්න තහවුරු කර ගැනීම.

07.4 අදාල පාඨමාලාවේ මට්ටම (සහතික පත්‍ර / ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා /NVQ මට්ටම පිළිබඳව පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම.
(වාර්තාවේ ඉහත කාරණාවලට අදාළ තොරතුරු පැහැදිලිව සටහන් කළ යුතුය.)

08. අභ්‍යන්තර පදනම යටතේ ඇති අයදුම්පත් කැඳවීම් සිදු කර ඇති විට, අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂා කර බලා තනතුරට අදාළව ඉල්ලුම් කරන සතුටුදායක සේවා කාලය හා විනය දඬුවම් ලබා ඇත්ද යන්න පිළිබඳව හා ස.සේ.කො.3/2020 හි 10.4 වගන්ති ප්‍රකාරව තනතුරට ඉල්ලුම් කළ හැකිද යන්න පරීක්ෂා කර බැලීම.

09. අදාළ තනතුර සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව, නිර්දේශ කරන ලද අයදුම්පත් සංඛ්‍යාව, හා ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු ඇතුළත් කරමින් ඇගයීම් මණ්ඩල වාර්තාවට ඇතුළත් කිරීම.

10. ඇගයීම් සිදු කරන ලද නිලධාරීන්ගේ නම් , තනතුරු සඳහන් කරමින් අත්සන් කිරීම හා නිල මුද්‍රා තබා ඇගයීම් වාර්තාව ඉදිරිපත් කිරීම.

එච්.එම්.පී.කේ.හේරත්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

e:\indra\පොදු උපදෙස් ලිපි 2024.doc